# ස්වයං අධ්‍යයනයට අත්වැලක්

## 9 ශ්‍රේණිය

## තෙවන වාරය

**නිපුණතා මට්ටම**

6.2 දේශීය නාට්‍ය ශෛලීන් අගය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි

**ක්‍රියාකාරකම**

**දේශීය නාට්‍ය වර්ග ඉගෙන ගනිමු.**




**සැකසුම :** **අංජලිකා ඒකනායක**

මප/වත්/එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක

ජාතික පාසල - කුණ්ඩසාලේ


**මෙහෙයවීම :** **නර්තන අංශය**

**කලාප අධ්‍යාපන කාර්යාලය - වත්තේගම**

## උපදෙස්

මෙය ලිඛිත පාඩමකි මෙය වැඩිපුර අධ්‍යයනය කිරීම සඳහා පාසලේ ගුරු ඇසුර ලබා ගත යුතුය.

## හැඳින්වීම

පෙර වසර වලදී භාව ප්‍රකාශනය තුලින් චරිත නිරූපණය කළ අයුරු ඔබට මතක ඇති. එහිදි එම චරිත නිරූපණය කළ සිද්ධින් තුල නාට්‍යයක ලක්ෂණ තරමක් දුරට හඳුනාගත හැකි විය. මෙම පාඩම තුලින් දේශීය නාට්‍ය වර්ග පිළිබඳ මූලික තොරතුරු ඉගෙනීමේ හැකියාව ඔබට ලැබෙනු ඇත.

මෙම ක්‍රියාකාරකම අධ්‍යයනය කිරීම තුළින් බලාපොරොත්තු වන්නේ

- නාට්‍ය යනු කුමක්ද ?
- නාට්‍ය ශෛලීන් වර්ග
- දේශීය නාට්‍ය වර්ග හා ඒවායෙහි සුවිශේෂී ලක්ෂණ
- ලංකාවේ නිෂ්පාදිත නාට්‍ය වර්ග යනාදී

කරුණු පිලිබඳ විස්තරාත්මක අධ්‍යනයක් ලබාදීමයි


123Freevectors.com




අවස්ථාවක් හෝ සිද්ධියක්
නළුනිළියන් මගින් ප්‍රේක්ෂකයන් ඉදිරියේ
රංග භූමියක් භාවිතා කරමින් සතර අභිනය
භාවිතයෙන් නිරූපණය කිරීමයි.

යමක් කර පෙන්වීම ලෙසද සරලව
හැඳින්විය හැකිය.

123Freevectors.com








**නාට්‍යයක් නැරඹීම තුල ප්‍රේක්ෂකයාට වින්දනයක් මෙන්ම තම ජීවිතයේ පවතින අඩුපාඩුකම් දුර්වල තැන් සකසා ගැනීමටත් සමාජයට යම් පණිවිඩයක් ද ලබාදිය හැකිය.**

# නාට්‍ය ශෛලීන් හඳුනාගැනීම




භරතමුනි නම් පඬිවරයා විසින් ලියන ලද නාට්‍ය ශාස්ත්‍ර පොතෙහි දැක්වෙන පරිදි නාට්‍ය ශෛලින් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.

**නාට්‍ය ශෛලීන්**

**ලෝකධර්මය**



ලෝකයේ ස්වභාවයට බෙහෙවින් සමීප වන ආකාරයට සතර අභිනය භාවිතා කරමින් රඟ දක්වන නාට්‍ය

**නාට්‍යධර්මී ශෛලිය**



නර්තන ගායන වාදන අනිවාර්ය ලෙස යොදාගනිමින් සතර අභිනය භාවිතා කරමින් රඟ දක්වන නාට්‍ය

## මෙම ශෛලීන් දෙකෙහි වෙනස්කම් හඳුනා ගනිමු

| ලෝක ධර්මී ශෛලිය | නාට්‍ය ධර්මී ශෛලිය |
|---|---|
| ස්වභාවික ලෝකයට වඩාත් සමීප ආකාරයෙන් රංගනයේ යෙදීම. | ස්වභාවික ලෝකයට වෙනස් අයුරින් අතිශයෝක්තියෙන් රංගනයේ යෙදීම. |
| එදිනෙදා භාවිතා කරන සංවාද යොදාගැනීම | රිද්මයානුකූල සංවාද භාවිතා කිරීම |
| ගමන් විලාසය සහ හැසිරීම් සාමාන්‍ය ජීවිතයේ දී මෙන් යොදා ගැනීම. | තාලානුකූලව ගමන් තාල යොදා ගැනීම |
| ඇඳුම් පැළඳුම් (රංග වස්ත්‍රාභරණ) අංග රචනය (මේකප්) සාමාන්‍ය ජීවිතේ චරිතයට ගැළපෙන ලෙස යොදා ගැනීම. | ඇඳුම් පැළඳුම් අංගරචනය ස්වභාවික තත්ත්වය ඉක්මවා අතිශයෝක්තියෙන් යොදා ගැනීම. |

123Freevectors.com

## දේශීය නාට්‍ය වර්ග

දේශීය නාට්‍ය යනුවෙන් මෙහි අප හඳුන්වන්නේ ශ්‍රී ලංකාවේ නාට්‍ය වර්ග පිළිබඳවයි. ඒ අනුව දේශීය නාට්‍ය වර්ග 4ක් දක්නට ලැබේ.

1. තාත්වික නාට්‍ය
2. ශෛලීගත නාට්‍ය
3. ගීත නාට්‍ය
4. මුද්‍රා නාට්‍ය

123Freevectors.c

## තාත්වික නාට්‍ය

අප අවට පරිසරයේ දී දකින විවිධ අවස්ථා හා සිද්ධීන් ඒ ආකාරයෙන්ම (යතානුරූපි) ස්වභාවිකව ඉදිරිපත් කරන අතර එය නරඹන්නාට තමාගේ අත්දැකීමක් ලෙස විඳ ගැනීමට හැකි නාට්‍ය තාත්වික නාට්‍ය වේ.


## සුවිශේෂී ලක්ෂණ

★ එදිනෙදා ජීවිතය භාවිතා කරන වචන, දෙබස් භාවිතය.

★ ඇඳුම් පැළඳුම්, අංගරචනය, වේදිකා සැරසිලි සැබෑ ජීවිතයේ පවත්නා ආකාරයට යොදා ගැනීම.

ආර්. ආර්. සමරකෝන් මහතාගේ කැළණි පාලම, රංජිත් ධර්මකීර්ති මහතාගේ මෝදර මෝල නාට්‍ය උදාහරණ ලෙස දැක්විය හැකිය.

123Freevectors.com



ආර්. ආර්. සමරකෝන් මහතා



කැළණි පාලම නාට්‍ය



රංජිත් ධර්මකීර්ති මහතා





මෝදර මෝල නාට්‍ය

## ශෛලීගත නාට්‍ය

එදිනෙදා ජීවිතයේ දක්නට ලැබෙන විවිධ අවස්ථා හා සිද්ධීන් ස්වභාවයෙන් බැහැරව අතිශයෝක්තියෙන් වර්ණනා කෙරෙන නාට්‍ය ශෛලීගත නාට්‍ය වේ.

## සුවිශේෂී ලක්ෂණ

- ★ තාලය හා රිද්මය පදනම් කොටගෙන දෙබස් උච්චාරණය මෙන්ම නර්තනය යොදා ගැනීම .
- ★ චරිත වේදිකාවට කැඳවීම කරනුයේ පොතේගුරු විසිනි ඊටම ආවේණික වූ ශෛලියක් පොතේගුරු විසින් අනුගමනය කරයි.




- ★ අභිනයන් මගින් චරිත නිරූපණය කිරීම.
- ★ ස්වභාවිකත්වය ඉක්මවා ගිය වෙස් මෝස්තර යොදාගැනීම.
- ★ ගමන් තාල යොදා ගැනීම.

මහාචාර්ය එදිරිවිර සරච්චන්ද්‍ර මහතාගේ මනමේ, සිංහබාහු නාට්‍යද, හෙන්රි ජයසේන මහතාගේ කුවේණී, හුණුවටයේ කථාව, දායානන්ද ගුණවර්ධනයන්ගේ නරිබෑණා, මධුර ජවනිකා යන නාට්‍යද, උදාහරන ලෙස දැක්විය හැක.




මහාචාර්ය
එදිරිවීර සරත්චන්ද්‍ර
මහතා



සිංහබාහු



මනාමේ




හෙන්රි
ජයසේන මහතා



කුවේණී



හුණුවටේ කතාව



දායානන්ද ගුණවර්ධන
මහතා.



නරිබෑණා



මධුර ජවනිකා

# ගීත නාට්‍ය

නාට්‍යයට අදාල සියලුම දෙබස් ඉදිරිපත් කරන්නේ ගායනයෙන් නම් ඒ ගීත නාට්‍ය වේ

## සුවිශේෂී ලක්ෂණ

- නළුනිළියන් ගායනයේ, යෙදිය යුතු බැවින් ඔවුනට රඟපෑම සහ ගායනය යන අංශ දෙකෙහිම එක හා සමාන දක්ෂතා තිබිය යුතුය

- වාචික අභිනයට ප්‍රමුඛස්ථානය ලබා දීම


- අදහස් ප්‍රකාශනයේ දී ගීතය සමඟ රිද්මයානුකූල චලන යොදා ගනී.

මකුලොළුව මහතාගේ දොපානෝ නාට්‍යද,

එදිරිවිර සරච්චන්ද්‍ර මහතාගේ පේමතෝ ජායති සෝකෝ නාට්‍යද,

ප්‍රේමසිරි කේමදාස මහාතාගේ කැලෑමල් නාට්‍යද

උදාහරන ලෙස දැක්විය හැක.




මහලොළුව මහතා




දෙපානෝ නාට්‍ය



මහාචාර්ය
එදිරිවීර සරත්චන්ද්‍ර මහතා




පෙමතෝ ජායතී සෝකෝ



ප්‍රේමසිරි කේමදාස
මහතා




කැලෑ මල්

# මුද්‍ර නාට්‍ය

කිසියම් සිද්ධියක් අවස්ථාවක් හෝ කතාවක් එහි අදහස වාචික අභිනයෙන් තොරව චලනය මගින් ඉදිරිපත් කරන්නේ නම් එය මුද්‍රා නාට්‍යයක් වේ

## සුවිශේෂී ලක්ෂණ

- ★ සංගීතයට ප්‍රධාන තැනක් හිමිවේ.
- ★ සංගීතයට අනුව වාචික අභිනය තොරව නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීම.
- ★ ලාංකීය මුද්‍රා නාට්‍යවල සංවාද භාවිතය නොමැති වුවද පසුබිම් ගීත යොදා තිබීම විශේෂ ලක්ෂණයකි.
- ★ දේශීය මුද්‍රා නාට්‍ය ඉඟිනළු යනුවෙන්ද හැඳින්වේ.
- ★ දේශීය මුද්‍රා නාට්‍ය නාට්‍ය කලාවට ඉන්දියානු නර්තන ආභාසය ලැබී තිබිම.
- ★ නූතනයේ බටහිර මුද්‍රා නාට්‍ය වල ආභාසය ඇතැම් ශිල්පීන් යොදාගෙන තිබීම.

ශ්‍රී ලංකාවේ ප්‍රථම උද්‍යානය ලෙස 1936දී ශාන්තිදේව ඝෝෂ් නිෂ්පාදනය කළ සීතාභරණ ලෙස නම් කර ඇත.

# ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත මුද්‍රා නාට්‍ය



## චිත්‍රසේන මහතා

කරදිය, නළ දමයන්ති, චන්ඩාලිකා, ශිවරංග



## වජිරා මහත්මිය

හිම කුමරිය, රන් කිකිළි



## ප්‍රේමකුමාර එපිටවල මහතා

සැළලිහිණිය, පරවි ගමන



## එස් පණීභාරත මහතා

සත්පත්තිනි, ග්‍රහ අපලය

## ඉඹුල්ගොඩ මහතා

උදාව, රන්දැද

123Freevectors.com

# මුද්‍රා නාට්‍ය අවස්ථා කිහිපයක්



කරදිය



නල දමයන්ති




කුම්භී කතාව

123Freevectors.com